# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 752/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 03/05/2024

පැය 1120

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ**

**01. 2024.05.02 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 38 | 500 | බූලි 02<br>යකඩ බැරල් 01<br>ගෑස් සිලින්ඩර් 01<br>ගෑස් ලිප් 01<br>තඹ දඟර 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. නීති විරෝධි කෘෂි රසායනික ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුරේ**

පොලිස් විශේෂ කාර්ය බලකා තලවකැලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත 2024.05.02 වන දින දහවල් කාලයේ පූඩළුඔය පොලිස් වසමේ පූඩළුඔය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **නීති විරෝධි කෘෂි රසායනික පැකට් 24 ක් හා කෘෂි නාශක පැකට් 16 ක්** සැකකරුවකු අත් අඩංගුවට ගෙන පූඩළුඔය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වූ පූඩළුඔය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. පූඩළුඔය පොලිස් ස්ථානය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2024.05.02 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කුරුණෑගල පොලිස් වසමේ පොල්අත්තාපිටිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 390 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 31 ක් වූ මොරටුව** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2024.05.03 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුත්තලම පොලිස් වසමේ මක්කල්පුරම් ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 400 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 21 ක් වූ පුත්තලම** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05.** **මෙරට නිශ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර.**

2024.05.02 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පුලියන්කුලම පොලිස් වසමේ සන්නාසිපරන්තන් ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මෙරට නිශ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා** ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුලියන්කුලම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 55 ක් වූ පුලියන්කුලම** ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. පුලියන්කුලම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06.** **මෙරට නිශ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුර.**

2024.05.02 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පොතුවිල් පොලිස් වසමේ හැඩඔය ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මෙරට නිශ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 23 ක් වූ ලාහුගල ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. පොතුවිල් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07.** **නීති විරෝධි ලෙස බලපත්‍ර නොමැතිව ජේසිබි යන්ත්‍රයකින් පස් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර.**

2024.05.02 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කරතගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ලුණුගම්වෙහෙර පොලිස් වසමේ තිස්සමහාරාම ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර නීති විරෝධි ලෙස **බලපත්‍ර නොමැතිව ජේසිබි යන්ත්‍රයකින් පස් කැණීම් කරමින් සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 33 ක් වූ ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**